රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 11/2014

මගේ අංකය : EST/8/ALLOW/03/144/3
රාජ්‍ය පරිපාලන සහ
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07.

2014.04.30

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**<u>"දැයට කිරුළ" ජාතික සංවර්ධන ප්‍රදර්ශනයට සහභාගී වූ නිලධරයන් සඳහා දීමනා ගෙවීම</u>**


2014 "දැයට කිරුළ" ජාතික සංවර්ධන ප්‍රදර්ශනයේ රාජකාරී කටයුතු සඳහා සහභාගී වූ අතිකාල දීමනා අහිමි නිලධරයන්ට සංයුක්ත දීමනාවට සමාන වූ අමතර විශේෂ දීමනාවක් ගෙවීම අනුමත කරමි.

02. නවාතැන් හා ආහාර පාන රජයේ වියදමින් සැපයීම නිසා සංයුක්ත දීමනා නොගෙවන ලද නිලධරයන්ට මෙන්ම, ඒවා නොසැපයීම නිසා සංයුක්ත දීමනා ගෙවූ නිලධරයන්ට ද මෙම විශේෂ දීමනාව ගෙවිය හැකිය.

03. අතිකාල දීමනා හිමි නිලධරයන්ට මෙම චක්‍රලේඛය යටතේ විශේෂ දීමනාව හිමි නොවන අතර පවත්නා විධිවිධාන අනුව අතිකාල දීමනා ලබා දිය හැකිය.

04. 2014.02.21 දින සිට 2014.03.01 දින තෙක් කාල පරිච්ජේදය තුළ සාමාන්‍ය කාර්යාල වේලාවෙන් බැහැරව ප්‍රදර්ශන රාජකාරි වල නිරත වූ දින සඳහා පමණක් මෙම විශේෂ දීමනාව ගෙවිය යුතු වේ.

05. මෙම චක්‍රලේඛය මහා භාණ්ඩාගාරයේ එකඟත්වය ඇතිව නිකුත් කෙරේ.



පී.බී. අබේකෝන්
ලේකම්
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය